# රතු තරුව
செந்தாரகை

**2015 අගෝස්තු 17 මැතිවරණ විශේෂ අතිරේඛය...**

සිංහල දෙමළ බසින් පළවන එකම සමාජවාදී පුවත්පත - එක්සත් සමාජවාදී පක්ෂයේ ප්‍රකාශනය

2015 - අගෝස්තු - 109 කලාපය - QD/162 | පුවත්පතක් ලෙස මහ තැපැල් හලේ ලියාපදිංචි කරන ලදී | මිල රු. 10.00



ජවිපෙ නව ගමනෙහි අවසාන බේදවාචකය 2

විප්ලවීය වමක් ගොඩනැංවීම උදෙසා 3

ඔබේ ඡන්දයට වටිනාකමක් දෙන්න 4


එක්සත් සමාජවාදී පක්ෂයේ වෙබ් අඩවියට පිවිසෙන්න
www.lankasocialist.com

# බොරු පොරොන්දු දේශපාලනයට එරෙහිව...




එක්සත් සමාජවාදී පක්ෂය ඇතුලු සංවිධාන කීපයක් ග්‍රීසියේ තානාපති කාර්යාලය වෙත පාද යාත්‍රා වෙන් පිවිසි අන්දම ... සුමණසිරි ලියනගේ, ලීනස් ජයතිලක, නීල් විජේතිලක සහ ඇන්ටන් මාකස් සමග...

# සමාජවාදී ප්‍රවේශයක්...

**තවත් මැතිවරණයක් සඳහා ඡන්දය පාවිච්චි කිරීමට ජනතාවට අවකාශයක් නැවත ලැබී ඇත. එනම් මීලඟ පාර්ලිමේන්තුව සඳහා මහජන නියෝජිතයන් පත් කර ගැනීමට ජනතාවට වරමක් ලැබී තිබේ. මෙම අවස්ථාව නිවැරදි ලෙස භාවිතා කරමින් නිදහසින් පසු වසර 67ක් අප රට අගාධයට පත් කරන ලද එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රීලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ඊනියා සන්ධානය පරාජය කර වමේ බලයක් ගොඩනගා ගැනීමට අඩිතාලම දමා ගැනීමට අවස්ථාව උදාකර ගත හැකිය.**



සිරිතුංග ජයසූරිය ඇතුලු පිරිස ග්‍රිසියේ තානාපති කාර්යාලයට පෙත්සම බාර දෙමින්

සුපුරුදු පරිදි ජනාතාව මුලා කිරීම සඳහා මැතිවරණ පොරොන්දු දීම තරඟයට මෙන් සිදු කරමින් පවතී. වසර නමයක් තිස්සේ දූෂණයෙන් භීෂණයෙන් රට විනාශ කළ මහින්ද රාජපක්ෂ නැවත අනාගතයට සහතිකයක් සමග අලුතෙන් පටන් ගැනීමට දෙන පොරොන්දු මහා විහිලුවක් බවට පත්ව ඇත. එක්සත් ජාතික පෙරමුණ ද අලුත් රටක් නමින් පංචවිධ ප්‍රතිපත්තියක් දොරට වඩම්මා ඇත. දින සියයකින් නොහැදුන රට මාස 60 කින් හදන බව රනිල් වික්‍රමසිංහ කියා සිටියි. අලුත් රටක් කියමින් එජාපයේ පරණ වැඩ පිලිවෙල එළියට දමා ඇති බව නම් පැහැදිලිය. ජනතා විමුක්ති පෙරමුණද ධනපති පක්ෂ අනුගමනය කරමින් හෘද සාක්ෂියේ සම්මුතිය නමින් තවත් රැවටිල්ලක් ඉදිරිපත් කර ඇත. කම්කරු පංතිය, වෘත්තිය සමිති ව්‍යාපාරය හා සමාජවාදය ගැන වචනයක් වත් සඳහන් නොකරන හෘද සාක්ෂිය ධනපති පංතිය හා අධිරාජ්‍යවාදී ප්‍රාග්ධනය සමග නවලිබරල් වාදය සමග සම්මුතියක් ගසා ඇති බව නම් ඉතා පැහැදිලිය. වමේ ව්‍යාපාරය හා සමාජවාදය වෙනුවෙන් කලක් ව්‍යාජ ලෙස පෙනී සිටි ජවිපෙය හෘද සාක්ෂියේ සම්මුතිය තුලින් ධනපති පක්ෂයක් බවට පරිවර්තනය වී ඇති බව හොඳින් දැකිය හැක.

මෙම පරිසරය තුල කම්කරු පංතිය ගොවීන් හා තරුණයන් ඇතුලු සමස්ත පීඩිත ජනතාව ඉදිරියේ ඉදිරිමග නිවැරදිව තෝරා ගැනීමේ වගකීමක් පැවරී ඇත. රට මෙතුවක් කල් ආණ්ඩුව කළ සිංහල ධනපති පක්ෂ දෙක හා ධනපති දේශපාලනයට අනුගතව සිටින ජවිපෙය පරාජය කර සැබෑ වමේ බලයක් ගොඩ නැගීමට පියවර ගැනීම එම වගකීමය. අප රට මුහුණ දෙන සමාජ, ආර්ථික හා දේශපාලන අර්බුදය හමුවේ සමාජවාදී වැඩ පිළිවෙලක් ඉදිරිපත් කරමින් දෙමළ ජනතාව මුහුණ දෙන ජාතික පීඩනය විසඳීම සඳහා ස්වයං නිර්ණය අයිතිය පිළිගන්නා වූ එකම දේශපාලන පක්ෂය වන එක්සත් සමාජවාදී පක්ෂයේ නියෝජිතයන් සඳහා අගෝස්තු 17 වෙනි දින පැවැත්වෙන ඡන්දයේදී ඡන්දය පාවිච්චි කිරීම ප්‍රගතිශීලි ජනතාවගේ එකම තෝරා ගැනීම විය යුතුය.

**ධනවාදයට හා ජාතිවාදයට එරෙහි වමේ බලයක් කරා පෙරට ....**

# සියලු ආකාරයේ ජනතා අයිතීන් දැඩි කප්පාදු කිරීමට එරෙහි විප්ලවීය වමක් ගොඩනැංවීම උදෙසා



**සෙකිනිමා පුවත් පතේ කතෘ මණ්ඩලයේ ප්‍රකාශයකි. සෙකිනිමා යනු එක්සත් සමාජවාදී පක්ෂයට සම්බන්ද ග්‍රීක සංවිධානයේ පුවත් පතයි.**

ජුලි 9 වැනිදා ග්‍රීසියේ වාමාංශිකයනට අඳුරු දිනයක් විය. අගමැති ඇලෙක්සිස් සිප්‍රාස් සමග සිටින සිරිසා පක්ෂය මෙහෙයවනු ලබන කණ්ඩායම ට්‍රොයිකාව වශයෙන් හඳුන්වන (යුරෝපීය සංගමය (EU) අන්තර්ජාතික මූල්‍ය අරමුදල (IMF) යුරෝපීය මහ බැංකුව විසින් ඉදිරිපත් කළ ඉල්ලීම් වලට සහමුලින්ම හා නියත වශයෙන්ම යටත් වූහ. ග්‍රීක කම්කරු ජනතාව මූල්‍ය අරමුදලේ ප්‍රතිපත්ති නිසා ඉතා දුඛදායක තත්වයකට පත්ව සිටිති. ඔවුහු සිය ඡන්දය සිරිසා වෙත ලබා දුන්නේ ඔවුන් මුහුණ පා සිටින ප්‍රශ්න වලට විසඳුම් ලබා ගැනීමටත් දැඩි කප්පාදු සඳහා වන යෝජනාවලියෙන් ගැලවීමක් ලබා ගැනීමටත්ය. එහෙත් රජය මාස පහක පමණ කාලයක් ගෙවා දැමීමෙන් පසුව සිරිසා පක්ෂයට ලබා දිය හැකි වූ එකම දෙය වූයේ මීට පෙර රජයන් ඉදිරිපත් කල දැඩි කප්පාදු කිරීම් සහිත ප්‍රතිපත්ති වලටත් වඩා ඉදිරියට ගිය මහා විනාශකාරී යෝජනාවලියකට සිය එකඟත්වය ලබා දීමය.

අද දිනයේ වාමාංශික ව්‍යාපාරයේ අදහස් හා මූලික ඉල්ලීම් පාවා දෙන පිරිස එදා එක් දිනක් ඇතුලත එකම එක් නීතියක් මගින් එම යෝජනාවලිය අවලංගු කරන බවට පොරොන්දු වූ පිරිසම බව වැඩ කරන ජනතාවට කිසි විටෙකත් අමතක නොවේ. වැඩ කරන ජනතාවගේ බලය ගැන හා තමාගේ ඉරණම තමා වෙතම පවරා ගැනීමට එම ජනතාව සතු හැකියාව ගැන සිරිසා නායකත්වය කෙදිනකවත් විශ්වාසය තැබුවේ නැත. ට්‍රොයිකාව සමග කුමන වූ සාකච්ඡා පැවැත්වූවද ඒ සියල්ල නොසලකා හරිමින් තෙසලොනිකි වැඩ සටහන ( Thessalonki Programme - සිරිසාගේ වඩාත් විප්ලවකාරී පූර්ව මැතිවරණ පොරොන්දුව විය. ) ක්‍රියාත්මක කරන බවට පොරොන්දු වූයේද මෙම පුද්ගල කණ්ඩායම විසින්මය.

මෙම අවස්ථාවේ පවත්නා විශාල කාර්යභාරයට සංවේදී විමට මෙන්ම වැඩ කරන ජනතාව ඔවුන් කෙරෙහි තැබූ විශ්වාසය රැක ගැනීමට ඉතා කණගාටුදායක ලෙසම තමාට හැකියාවක් නොමැති බව සිරිසා හා ඇලෙක්ස් සිප්‍රාස් නායකත්වය දෙන පිරිස ඔප්පු කර ඇත. යුරෝපය පුරාම මෙන්ම සමස්ත ලෝකය පුරාම රැව් පිලිරැව් දුන් ජුලි 5 දා ග්‍රීසියේ පැවති ජනමත විචාරණයේ දී මුලු ලොවම සෙලවීමට සමත් වූ එපා යන ඡන්දයේ හඩට අයිති කරුවන් වීමට ඔවුහු කිසිසේත් සුදුස්සෝ නොවෙති. ග්‍රීසියේ පැවැති එම ජන මත විචාරණයේ දී එපා යන තීරණයට සියයට 70 - 80 දී දක්වා වන සංඛ්‍යාවක් ඡන්දය පාවිච්චි කල වැඩ කරන ජනතාව හා නාගරික ප්‍රදේශවල ජීවත් වන කම්කරුවන් විශ්‍රාමිකයින් රැකියා විරහිත පිරිස් හා දිලිඳු ජනතාව ඔවුන් කෙරෙහි තබා තිබූ විශ්වාසය ඔවුහු පාවා දුන්නා. එපමණක් නොව වාමාංශික පිරිස් හා වැඩ කරන ජනතාව විසින් දියත් කරනු ලැබූ ශ්‍රේෂ්ඨ අරගලයත් එම අරගලයට තම සහාය පලකල සමස්ත යුරෝපීය කම්කරු පන්තියත් ඔවුහු නින්දිත ලෙස පාවා දුන්හ.

### හැරවුම් ලක්ෂ්‍යය

ජුලි 9 වනදා ඓතිහාසික දිනයකි. ඒ එදින වාමාංශික පක්ෂයක් වූ සිරිසා පක්ෂය ධනවාදී පද්ධතියේ සේවය සඳහා උපයෝගී වන පක්ෂයක් බවට ප්‍රසිද්ධියේම පරිවර්තනය වූ හෙයිනි.

සිප්‍රාස් හා පාලක කණ්ඩායක යලි කිසිසේත් ආපසු හැරෙන්නට නොහැකි ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග තීරණයකට එළඹ සිටියහ. එමගින් ඊයේ දිනයේ සතුරන් ලෙස සිටි පිරිස් සමග එක්ව ජාතික ආණ්ඩුවක් බිහි කිරීමට ඒ සදහා අවශ්‍ය වේ නම් වාමවාදී සිරිසා පන්නා දැමීමට සිප්‍රාස් හා ඔහුගේ කණ්ඩායම ඉදිරියටම යනු ඇත. මෙම ග්‍රීක වාමාංශයේ නව ඓතිහාසික බේදවාචකයට හේතුව වන්නේ ජීවත්වීමේ යථාර්ථය හා බැඳී ඇති පන්තිමය ගති ලක්ෂණ පිලිබඳව එම නායකත්වය තුල කිසිදු අවබෝධයක් නොමැති වීමය. පන්ති සටන යනු කුමක්ද යන්න ගැන කිසිදු අවබෝධයක් ඔවුන් සතු නොවීමයි.

තම යෝජනා සදහා සටන් කිරීම සදහා ඔවුන් යුරෝපීය සංගමය ඉදිරියට ගියේ සැබවින්ම කියතොත් මැෂින් තුවක්කු වෙනුවට සටන් කිරීම සඳහා සෙල්ලම් පිස්තෝල යොදා ගන්නා කුඩා දරුවකු මෙනි. ඔවුහු යුරෝපීය සංගමයේ ෂෝබල් හා අනෙකුත් ධනවාදී රැළ වෙත ඉතා අහිංසක ලෙස අඥාන ලෙස කරුණු පැහැදිලි කිරීමටත් ඔවුන් කෙසේ හෝ නම්මා ගැනීමටත් යත්න දැරූහ. එම ධනවාදී නියෝජිතයින් විසින් යොදා ගත්තේ වැරදි ප්‍රතිපත්ති බවත් ඒවා වෙනස් කල යුතු බවත් ඔවුහු බොලඳ ලෙස කියා සිටියහ. වැඩ කරන ජනතාවගේ බලය පිළිබඳව ඔවුනට කෙදිනක හෝ විශ්වාසයක් තිබුණේ නැත. තමාට අවශ්‍ය දේ ඉටු කර ගැනීමේ බලය කම්කරු පන්තියට ඇති බවට ඔවුහු විශ්වාස නොකළහ. පාලක ධනපති පන්තිය විසින් පුන පුනා කියාපාන ලද ඔවුන්ගේ ලාභාංශ පද්ධතියේ අනගිභවනීය බව හා ධනවාදය කිසි දිනෙක වත් පෙරලා දැමිය නොහැකි බව ද යුරෝ කළාපය වෙතින් ඉවත් වීම සමාජ ව්‍යසනයක් බවට පත් වනු ඇති බව යනාදී බොළඳ කථා විශ්වාස කිරීමට ඔවුනට සිදුවිය.

සිප්‍රාස් හා ඔහුගේ රජය ග්‍රීක කම්කරු පන්තිය අත් කර දුන් පරාජය ඓතිහාසික වෙයි. එහෙත් එය අවසානය නම් නොවේ. යම් ප්‍රතිවිරෝධයක් දියත් කිරීමට අවශ්‍ය ශක්තීන් රාශියක් තවමත් ග්‍රීක කම්කරු පංතිය සතුව තිබේ. අපට එය කෙරෙහි දැඩි විශ්වාසයක් තිබෙන බව පැහැදිලිව ප්‍රකාශ කළ යුතුය. මේ මොහොතේ ඉතාම අත්‍යාවශ්‍ය කාර්යභාරය වන්නේ ලෝක විප්ලවවාදී සමාජවාදයට අනුකුල වෙමින් අලුතෙන්ම යම් යම් කණ්ඩායම් නිර්මාණය විය යුතු බව අවබෝධ කර ගන්නා වාමාංශික බලවේග ඒකාබද්ධ වෙමින් ඊලඟ පියවර සඳහා සැලසුම් සකස් කිරීමය. පාර්ලිමේන්තුවට අයත් නොවන ඊට පිටතින් සිටින අප වැනි වාමාංශික පෙරමුණේ ඉතා දැඩි ක්‍රියාකාරී බලවේග ඇත. එමෙන්ම සිරිසා තුල හා ඇන්ටාස්යා (ධනවාදී විරෝධී වම) තුලද එවැනි ශක්තිමත් බලවේග ඇත. වඩා යහපත් ජීවිතයක් ලබා ගැනීම උදෙසා ධනවාදී ක්‍රමයෙන් බිඳී යාම හා යුරෝ කලාපය වෙතින් ඉවත්වීම අත්‍යාවශ්‍ය බව ඒ සියලු දෙනා මෙම අර්බුදය තුළ අවබෝධ කර ගෙන ඇත.

මෙම සියලු බලවේග වහාම එක්රැස් වී සාකච්ඡා කොට අවශ්‍ය පියවර ගත යුතුය. ඒ හෙට දවස උදෙසා අරගල කිරීමට පෙරමුණ ගැනීමටය. එමෙන්ම සිප්‍රාස් හා ඔහුගේ කණ්ඩායම දී ඇති ව්‍යාජ බලාපොරොත්තු වලට එරෙහිව අනාගතය වෙනුවෙන් ඉදිරි දර්ශණයක් ලෙස අරගලයක නිරත වීමට දෙනු ලබන පොරොන්දුවද සමගය.

### ග්‍රීක වාමාංශයට කුමන නම් වැඩ සටහනක්ද ,

සිප්‍රාස් නායකත්වය යටතේ එලිදැක්වුනු නවතම යෝජනාවලට විරුද්ධ වීමටත් ඒවාට විරුද්ධව ඡන්දය පාවිච්චි කිරීමටත් එක්වන ලෙස සෙකිනිමා පුවත්පත වාමාංශික වේදිකාවේ සිටින සිරිසා මන්ත්‍රීවරුන්ටත් අනෙකුත් වාමාංශික පක්ෂ වලට අයත් මන්ත්‍රීවරුන්ටත් අනෙකුත් වාමාංශික පක්ෂ වලට අයත් මන්ත්‍රීවරුන්ටත් අරාධනා කරයි.

03 පිටුවට....

## "මෝටර් සයිකල් සවාරියට පහරදී වසරයි"

# පරීක්ෂණ තවමත් හමස් පෙට්ටියේ





ජාතිවාදී ආගම්වාදී ගිනිදැල් අවුලුවා අලුත්ගම දර්ගා නගරයේ මුස්ලිම් වරුන්ට එරෙහිව දියත් කළ මේලෙච්ච ප්‍රහාරය හෙලා දැකීම වස් එක්සත් සමාජවාදී පක්ෂය සංවිධානය කළ මෝටර් සයිකල් සවාරියට පහරදී මේ වන විට වසරක් ගෙවී ඇත. 2014 ජුලි 26 වන දින කොළඹ නාරාහේන්පිට සිට අලුත්ගම දර්ගා නගරය දක්වා මෙම මෝටර් සයිකල් සවාරිය සංවිධානය කර තිබුණි. එම සයිකල් සවාරියට වාඩියමංකඩ හංදිය ආසන්නයේදී පොලිසිය බලා සිටියදී එතැනට කඩා වැදුනු සිවුරු පොරවාගත් මැර සංගයා වහන්සේලා පිරිසකගේ නායකත්වයෙන් තවත් මැර පිරිසක් සමග කඩු පොලු රැගෙනවිත් සාමකාමී සයිකල් සවාරියට පහර දෙන ලදී.

බොහෝ සංවිධාන කොළඹ නගරයේ කොටුව දුමරිය පොල ඉදිරිපිට පිකටින් පවත්වා ජාතිවාදය හා ආගම්වාදය නාමිකව හෙලා දකින පරිසරය තුළ එසපය ගම්දනවි හරහා දර්ගා නගරය දක්වා පහරදීමට එරෙහිව මෙම මෝටර් සයිකල් සවාරිය සංවිධානය කරන ලදි.

බෞද්ධ චීවරයට මුවාවී මැරයින් විසින් සිදුකල මෙම ප්‍රහාරය ගැන වීඩියෝ දර්ශණ පවා තිබියදී මේ දක්වා පොලිසිය විසින් ඊට සම්බන්ද අය අත්අඩංගුවට පත්කර අධිකරණයට ඉදිරිපත් කිරීමට පියවර ගෙන නොමැතිවීම පුදුම සහගතය. ඉන් අනතුරුව එක්සත් සමාජවාදී පක්ෂය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂමට පැමිණිලි කළ පසු පරීක්ෂණයක් පැවැත්වූ නමුත් එම කොමිෂමේ නියෝගයට අනුව චූදිත හිමිනම මෙතෙක් අත්අඩංගුවට පත්කර නොමැත. නීතියේ ආධිපත්‍ය ගෝඨාභයගේ අනසක යටතේ වල්වැදී තිබූ යුගයක නීතිය ක්‍රියාත්මක කිරීමට පොලිසිය අසමත්වුවද මෛත්‍රීපාල ජනාධිපතිවරයා ගේ යහපාලනය තුළ පවා නීතිය ක්‍රියාත්මක නොවීම තුලින් යහපාලනේ සැබෑ තේරුම කුමක්ද යන්න හෙළිදරව් වෙමින් පවතී.

53/6 ඊ.ඩී.දාබරේ මාවත, කොළඹ 05.
E.mail – unitedsocialists@gmail.com
Tel – 4510289 / 2504647
එක්සත් සමාජවාදී පක්ෂයේ වෙබ් අඩවියට පිවිසෙන්න - www.lankasocialist.com

# ජවිපෙ නව ගමනෙහි අවසාන බේදවාචකය

ජනතා විමුක්ති පෙරමුණ පසුගිය සතියේ ගාලා උත්සවයක් පැවැත්විය. Gala යන ඉංග්‍රිසි වදනට ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝශයේ දී ඇති එක අර්ථයක් වනනේ උත්සවාකාර ගොනුවීමක් මුලුදීමක් යන්නයි. (festive gathering) සුගතදාස ක්‍රිඩාංගනයේ පැවති මෙම ගාලා උත්සවය නම් කොට තිබුණේ විශේෂ සමුලුව නමිනි. එසේ වුවද දේශපාලන පක්ෂ විසින් සමුලු නැතහොත් සම්මේලන යනුවෙන් හදුන්වන කිසිදු ලක්ෂණයක් මේ විශේෂ සමුලුවෙහි නොවෙති අනුර කුමාර ටිල්වින් සිල්වා වැනි ජවිපෙ නායකයන් ඇඳ පැළැඳ සිටි ආකාරය ශාලාව සරසා තිබු ආකාරය අනුව එය සහ මුලින්ම ගාලා උත්සවයක් විය.

මෙවර මැතිවරණයට මුහුණ දීම සඳහා ජවිපෙ තේමාවන් දෙකක් යොදා ගෙන ඇත. දේශයේ හෘදය සාක්ෂිය ඉන් ප්‍රධාන තේමාවයි. රටේ හෘද සාක්ෂිය තමන් බව ඔවුන්ගේ අදහසයි. මෙය හුදෙක්ම දූෂණයට වංචාවට අල්ලසට එරෙහිව ජනයා තුළ පවත්නා විරෝධය ගසා කෑම සඳහා යොදා ගත් මාවතක් පමණි. ඔවුන් පෙන්නුම් කරන්නේ රටේ අනෙකුත් සියලු (ප්‍රධාන) දේශපාලන පක්ෂ දූෂණයෙන් වංචාවෙන් කිලිටි වී ඇති අතර එකම නොකැළැල් පක්ෂය තමන් බවය අනෙත් සියලු දෙනා කලුය තමන් විතරක් සුදුය යන සරල සමීකරණයක් ජනතාවට ඒත්තු ගැන්වීමට ජවිපෙ උත්සාහ දරන බව පෙනේ.
මහින්ද රාජපක්ෂගේ අතිශය දූෂිත දසවසරක පාලනයකින් පසු යහපාලනයක් ගොඩනගන බවට පොරොන්දු වී බලයට පැමිණි මෛත්‍රී - රනිල් පාලනයටද දූෂණ චෝදනා (මහබැංකු බැඳුම්කර සිද්ධිය ඇතුලුව) එල්ල වන පරිසරයක් තුළ එකම පිරිසිදු දේශපාලන පක්ෂය තමන් බවට ජවිපෙ නගන මහා ඝෝෂාවට ජනයා තුළ යම් අනුකුලතාවක් ලබාගැනීම අනුර කුමාරගේ ඉලක්කයවී තිබේ. ඇතැම් පෞද්ගලික විද්‍යුත් නාලිකාවල විශේෂ අනුග්‍රහය ඇතිව පසුගිය කාලය පුරා ඔවුන් නැගු මේ අඩහැරය මීට මා කීපයකට පෙර හීන වෙමින් පැවතිනි. ජවිපෙ නායකත්වය මෛත්‍රි - රනිල් ආණ්ඩුවේ ඉහළම ව්‍යුහය වු ජාතික විධායක සභාවේ නිත්‍ය සාමාජිකත්වය වෙනවාට අමතරව අනුර කුමාර දිසානායක එහි මාධ්‍ය ප්‍රකාශක බවටද පත්විය. පෙබරවාරි මස අවසාන දින කීපයේ සිදුවු මහ බැංකු බැඳුම්කර කොල්ලය ගැන අනුර කුමාර මෙම විධායක සභාවේදී කෙඳිරියක් හෝ නැගු බවත් වාර්තා නොවීය. එකී විධායක සභාව කාලය ඇවෑමෙන් ඉබේ විසිරෙන තුරුම එහි එල්ලී සිටි අනුර කුමාර පහුගිය මාස දෙකක පමණ කාලයේ සිට එකී වංචාව ගැනත් බෙරිහන් දීමට පටන් ගත්තේ මෛත්‍රි - රනිල් පාලනයට කිහිලි කරුවක් වෙමින් ජවිපෙ ගෙන ගිය ද්‍රෝහී ක්‍රියා කලාපය හමුවේ ජවිපෙ නායකත්වය නිරුවත් වන තත්වයක් උද්ගත වෙමින් පැවති බව පෙනී යාම නිසාය. රාජපක්ෂ පවුල ඇතැම් රෙජිමයේ දූෂණ වංචා තවදුරටත් හෙළිදරවු වීමත් ඒවා ගැන ක්‍රියා කිරීමේදී වත්මන් ආණ්ඩුව දැක්වු උකටලී බවත් නිසා ජවිපෙට නැවත වරක් තමන් වෙතින් ගිලිහී යමින් තිබු දූෂණ විරෝධී තුරුම්පුව අතට ගැනීමට දගලනු පෙනේ.

රට වෙනුවෙන් නව ගමනක් යනු ජවිපෙ හි අනෙක් මැතිවරණ තේමාවයි. එය නම් බොහෝ දුරට ජවිපෙහි වත්මන් නායකත්වයේ ක්‍රියාකලාපයට ගැලපෙන්නකි. අනුර කුමාර දිසානායක තීරණාත්මක ලෙස ජවිපෙහි පරණ හම ගලවා දමමින් සිටී. මෙය එක්තරා අයුරකින් චීනයේ මාඕ සේතුංගේ මරණයෙන් පසු ඩෙංෂියාඕපින්ගේ නායකත්වයෙන් කොමියුනිස්ට් පක්ෂය තුළ සිදු කරන ලද විපරිවර්තනයට සමානය. එහිදී කොමියුනිස්ට් පක්ෂ නාමය සහ නිලධාරීවාදී ව්‍යුහය එලෙසම පවත්වා ගනිමින් පක්ෂයේ වැඩ පිළිවෙල මුලුමනින්ම පාහේ ධනේශ්වර වැඩ පිළිවෙලක් බවට පත් කරන ලදී. ඩෙං එදා කොමියුනිස්ට් පක්ෂය ධනේශ්වරීකරණය (bourgoisification) හැඳින්වූයේ නව දැක්ම (New vision) යනුවෙනි. අනුර කුමාර ධනේශ්වරීකරණය හැඳින්වූයේ අපේ දැක්ම **(Our vision)** යනුවෙනි. ජවිපෙහි මේ රට වෙනුවෙන් යන නව ගමන එකී අපේ දැක්මෙහිම දිගුවකි. වාමාංශික නැඹුරුවක් සහිත කම්කරු පන්ති පක්ෂයක් ලෙස පැවති බ්‍රිතාන්‍ය ලේබර් පක්ෂය ටෝනි බ්ලෙයාර්ගේ නායකත්වය යටතේ ධනපතියන්ට සහ හාම්පුතුන්ට ගැලපෙන පරිදි ධනේශ්වරීකරණය කරන ලද පරිද්දෙන්ම අනුර කුමාර දිසානායකගේ නායකත්වය යටතේ ජනතා විමුක්ති පෙරමුණද සිංහල ගැමි - ගොවි සුලු ධනේශ්වර පක්ෂයකින් එහාට ගොස් නාගරික මධ්‍යම පන්තියට සහ ඉහළ ධනේශ්වරයට පිලිගත හැකි විස්වසනීය සංවිධිතයක් බවට පත් වී තිබේ.

වැඩ වසම්වාදයේ ජීවමාන සංකේත වන බෞද්ධ භික්ෂුන් (සහ අනෙකුත් පූජකවරුන්) ට දණ්ඩ නමස්කාරයෙන් වැඳ වැටුනු අනුර කුමාර ටිල්වින් ඇතුලු ජවිපෙ නායකයන් සංකේතාත්මකව පෙන්නුම් කළේ අප රට සමාජයේ පවත්නා පසුගාමීත්වය කඩා බිඳ ගෙන ඉදිරියට යාමට ජවිපෙ සුද ානම් නැති බවයි. මේ පසුගාමී ධනේශ්වර සමාජයේ පවත්නා කිසිදු සාම්ප්‍රද ායික සමාජ සංස්ථාවකට අභියෝග කිරීමට ජවිපෙ ඉදිරිපත් නොවෙයි. ඔවුන් පවත්නා වැඩවසම් ගති පැවතුම් රැකගෙන නව ගමනක් යන්නට උත්සුක වන බවක් මිසක් රට වෙනස් කරන නව ගමනක් යන්නට සුදානම් නැත. ඒ අනුව ආගම ඇතුලු පවත්නා සමාජ සංස්ථා ගතානුගතික හර පද්ධතීන් සහ ස්ථාපිත ව්‍යුහයන් එලෙසම රැක ගැනීමට ජවිපෙහි කැපවීම පෙන්නුම් කර තිබේ.

අනුර කුමාර දිසානායක එදින ශාලාව දෙදරන හඩින් පොරොන්දු මාලාවක් දුන්නේය. පවුල් ගත වන හැම පවුලකටම නිවසක් ලබා දීම සහතික කරනවා. අධ්‍යාපනයේ සෞඛ්‍යයේ වගකීම රජය භාර ගන්නවා හැම තරුණයෙකුටම රැකියාවක් ලබා දෙනවා කරනවා දෙනවා ආදී වශයෙන් ඔහු කළේද මහින්ද රනිල් මෙන් හිස් මැතිවරණ පොරොන්දු මාලාවක් කියාපෑම පමණි. එහෙත් ප්‍රශ්නය වන්නේ මේ පොරොන්දු ඉටු කිරීම සඳහා යොදා ගන්නා සංවර්ධන මාදිලිය නැතහොත් ක්‍රමවේදය කුමක්ද යන්නයි.

තොල් විදහාගෙන දහසක් පොරොන්දු දුන් අනුර කුමාර දිසානායක මේ තීරණාත්මක කරුණ ගැන වචනයක හෝ නොකීමට පරිස්සම් විය. බැංකු රක්ෂණය සහ වෙනත් බැර කර්මාන්ත ඇතුලු රටේ ආර්ථිකය ග්‍රහණයට ගෙන සිටින මුදුන් මුල් එලෙසම හිටින්නට ඉඩ හරිනවාද ? නොඑසේ නම් ප්‍රජාතන්ත්‍රිය කම්කරු පාලනයක යටතේ ඒවා ජනසතු කරනවාද? ජවිපෙ නායකයන් පුන පුනා කියන විදේශීය ණය ඒ අයුරින්ම ගෙවනවාද? ග්‍රීසියේ වත්මන් සිරිසා රජය කළ අයුරින්ම ලෝක ධනපති පන්තිය ඉදිරියේ යටත් වෙනවාද? නැතහොත් ජනතාවගේ හැබෑ බලයක් මත දෙපය තබා ඒ ණය ගෙවීම ප්‍රතික්ෂේප කරනවාද? ඉතාම සරල ප්‍රශ්නය නම් ජවිපෙ පවත්නා ධනවාදී සංවර්ධන මොඩලය එලෙසම අනුගමනය කරනවාද නැද්ද යන්නයි.

මේ සියල්ලටත් වඩා ප්‍රධාන ප්‍රශ්නය වන්නේ අපේ රටේ පවතින තීරණාත්මක ප්‍රශ්නය වන දෙමළ ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා ජවිපෙ අනුගමනය කරන ක්‍රියා මාර්ගය කුමක්ද යන්නයි. ධනපති රාජ්‍ය තන්ත්‍රය වෙතින් අරගල - සටන් හරහා දෙමළ ජනයා දැනට ලබා ගෙන ඇති සීමිති බලය බෙදීමවත් නොපිළිගන්නා ජනතා විමුක්ති පෙරමුණ යල් පැන ගිය එකීය රාජ්‍ය රාමුව බිඳ දමන්නට ලෑස්තිද නැද්ද? දෙමළ ජනයා ජාතියක වශයෙන් පිළිගෙන ඔවුන් සමග සමාන ලෙස රාජ්‍ය බලය බෙදා හදා ගැනීමට එකඟද නැද්ද? දේශයේ හෘද සාක්ෂිය මේවා ගැන ගොලු වත රකී. විජේවීරගේ පරණ ප්‍රකාශ උපුටා දක්වා අද පවතින ඇත්ත ප්‍රශ්නයට විසඳුම් සෙවිය නොහැකිය. මේ අතිශය සංවේදී ප්‍රශ්නයට විස!ඳුම් නොමැතිව ජවිපෙ නව ගමන නවතින්නේ වල පල්ලෙන් බව කිව යුතුය.

ජනතා විමුක්ති පෙරමුණ මැයි දිනය සමරන්නේ රතු මැයි රැලිය වශයෙනි. මාක්ස්, එංගල්ස්, ලෙනින්ගේ ලොකු පින්තූර ගසා ඔවුන් කියන්නේ තමන් සමාජවාදී පක්ෂයක් බවය. එහෙත් මේ ගාලා සමුලුවේදී අනුර කුමාර සමාජවාදය ගැන වචනයක් හෝ සඳහන් කළේ නැත. ජරාජීර්ණව ඔද්දල් වී ගඳ ගහන ධනවාදය පෙරළා දමා සමාජවාදී සමාජයක් ගොඩ නැගීමෙන් තොරව අපේ රටේ ජනයා පෙළන ප්‍රශ්න වලට විසඳුම් නැති බව වඩ වඩාත් තහවුරු වෙමින් තිබියදී ජවිපෙ නායකත්වය වඩ වඩාත් ධනවාදය වැළඳ ගනිමින් දක්ෂිණාංශයට බර වෙමින් සිටී.

මේ නායකත්වයට අවශ්‍යව ඇත්තේ ඉහළ ධනපති පන්තිය ඇතුලු සමාජයේ උපරි ව්‍යුහයට අනුගත විය හැකි පරිදි පක්ෂය නිර්මාණය කිරීමටය. සමුලුව පවත්වා සතියක් යන්නටත් පෙර අනුර කුමාර තම හෘද සාක්ෂිය රැගෙන මල්වතු - අස්ගිරි මහානායකවරුන් හමුවේ වැඳ වැටුනේ එහෙයිනි. පවතින සමාජ ක්‍රමය පුපුරුවා හරින විප්ලවවාදී පක්ෂයක් බවට හඟවමින් පෙරට ආ ජවිපෙ අද පවතින ක්‍රමයට අනුගත වන්නේ සීඝ්‍රතාවකිනි. කම්කරු පන්තිය ඇතුලු පීඩිත ජනයා ධනපති පන්තියට පාවා දීමේ දේශපාලන පාප කර්මය හැර පැරණි සමසමාජ කොමියුනිස්ට් නායකයින් වත්මන් ජවිපෙ නායකයන් තරම් පිරිහුනේ නැත. ජවිපෙ ඒකායන අරමුණ කුමක් තරම් හොඳ මහත්වරුන් තවත් නැති බව පෙන්නුම් කිරීමය.

සමසමාජ - කොමියුනිස්ට් නායකයන් මෙන් ටයි කෝට් නොඇන්දද ජවිපෙ පාර්ලිමේන්තුවාදයට අද මුලුමනින්ම යට වී ඇත. පාර්ලිමේන්තුවෙන් පීඩිත ජනතා අරගලයක් ගැන කතා කරන්නේවත් නැත. ක්‍රමය වෙනස් කිරීම සඳහා සන්නද්ධ අරගල මාවත ප්‍රතික්ෂේප කළ අනුර කුමාර ටියුනීසියාවේ ඊජිප්තුවේ, ඉරානයේ, පිලිපීනයේ මෙන් පැන නැගෙන ජනතා අරගලයක් ගොඩනැගීමටද කිසිදු එකඟතාවයක් නැති බව පැහැදිලිය.

මේ තත්වය තුල ඉදිරි කාලය තුළදී ජවිපෙ දැවැන්ත අර්බුදයකට මුහුණ දෙනු ඇත. යුක්තිය සාධාරණය රජයන අලුත් දේශයක් ගොඩ නැගීම ගැන බලාපොරොත්තු සහගතව සිටින පීඩිත තරුණ තරුණියෝ විශාල පිරිසක් තවමත් ජවිපෙ සමග සිටී. 1971, 1987 - 89 කැරලි වලින් ඔවුහු ආස්වාදයක් ලබති. එම ක්‍රියාමාර්ග නිරර්ථවන සහ ජනතා ව්‍යාපාරය ගොඩ නැගීමට අවාසි සහගත වුවද ජවිපෙ ඉදිරියටත් ඒ වෙනුවෙන් පෙනී සිටිහු ඇතැයි ඔවුහු බලාපොරොත්තු වෙති. එසේ වුවද වත්මන් ජවිපෙ නායකත්වය එම තරුණ පිරිස් ඉතා ඉක්මනින්ම පාවා දෙනු ඇත. මෙහි අවදානම් පැත්ත වනුයේ ප්‍රායෝගික තලයේ ක්‍රියාත්මක කිරීම දුෂ්කර වුවද ඇතැම් තරුණ පිරිසක් නැවත විජේවීර සොයා යාමට යොමු විය හැකි වීමයි. ඒ ඔස්සේ නැවත වරක් දරුණු සංහාරයක් රට තුළ ඇති විය හැකිය. අනෙක් අතට තරුණයන් දේශපාලන ව්‍යාපාර සහ ක්‍රියාකාරකම් දෙස අවඥාවෙන් බලා සටන් ව්‍යාපාරයන් මුලුමනින්ම පාහේ පිළිකුල් කරන තත්වයක්ද උද්ගත විය හැකිය.

මේ තත්වයට මුහුණ දීම කළ හැක්කේ මේ දූෂිත සමාජ ක්‍රමය මුලින්ම පෙරළා දමා පන්ති සුරා කෑම දුරුකිරීම වෙනුවෙන් පෙනී සිටින කම්කරු පංති නායකත්වයේ විප්ලවකාරී වමේ බලවේගයක් ගොඩ නැගීමෙන් පමණි. ඒ සඳහා ජාත්‍යන්තර ඉදිරි දැක්මක් අවශ්‍යය. ජවිපෙයට ජාත්‍යන්තර දැකමක් නැත. එක්සත් සමාජවාදී පක්ෂය ඒ අරමුණ වෙනුවෙන් අඛණ්ඩව පෙනී සිටින අතර සමාජවාදය උදෙසා පීඩිත ජනයාගේ අරගලයක් නිර්මාණය කිරීමට කැප වී සිටි. දකුණේ මෙන්ම උතුරේත්, නැගෙනහිරත්, වතුකරයේත් පීඩිත ජනයා මේ වෙනුවෙන් ගොනු කර ගැනීම අපගේ වත්මන් අභියෝගය වන්නේය.

**- ශ්‍රිනාත් පෙරේරා -**

## නව ජනතා විප්ලවීය වමක් ගොඩනැංවීම උදෙසා

02 පිටුවෙන්....

මෙම නව සංදේශයේ ඇතුලත් ප්‍රතිපත්ති මාලාවට විරුද්ධව ඒකරාශී වන ලෙස කම්කරුවන්ට හා තරුණ කොටස් වලට ග්‍රීක වාමාංශීය විසින් ආයාචනා කල යුතුය. ඒ සඳහා ජනතා විරෝධතා හා උද්ඝෝෂණ සංවිධානය කරමින් පසුගිය දින පැවැති ජන මත විචාරණයේදී තදබල ලෙස ප්‍රකාශයට පත් වූ එපා යන ජනතා තීන්දුව සඳහා විශේෂ අවධානය යොමු කර සිය පන්තියේ අයිතිවාසිකම් කිසි ලෙසකින් හෝ අහිමි කර නොගත යුතු බව අවබෝධ කර දිය යුතුය.

දැඩි කප්පාදුවේ න්‍යාය කපා හරිමින් සමාජවාදී වැඩ සටහනක් දියත් කරන මෙන් සෙකිනිමා පුවත් පත වාමාංශිකයින්ට ආරාධනා කරයි. එමගින් ණය ගෙවීම ප්‍රත්කෙෂ්ප කිරීම, ප්‍රාග්ධන ගලනය පාලනය කිරීම, විදේශ වෙලඳාම සඳහා රාජ්‍ය ඒකාධිකාරය බැංකු ජනසතු කිරීම, ආර්ථික වර්ධනය උපරිමයට පත් කිරීමට යත්න දැරීම ආදිය ප්‍රජාතන්ත්‍රවාදී කම්කරුවන්ගේ පාලනයට හා කලමණාකරණයට යටත් වෙයි. එමෙන්ම ජනතා වරප්‍රසාද දැඩි ලෙස කප්පාදු කිරීමේ සැලසුම ප්‍රතික්ෂේප කළ යුතුය. අවශ්‍ය තරම් වැටුපක් සහිතව සෑම දෙනෙකුට රැකියා සැපයීමට හා යහපත් සෞඛ්‍ය සේවා අධ්‍යාපනය හා ශුභ සාධන කටයුතු නිදහස් ලෙස පවත්වා ගෙන යාම සිදු වන බවට සහතික කළ යුතුය. ආර්ථිකය සැලසුම් කල යුත්තේ ධනවාදීන්ට ලාභ උපයා දීමට නොව පොදු ජනතාවගේ අවශ්‍යතාවයන් සපුරා ලීමටය. සමාජයේ සමාජවාදී ප්‍රති සංවිධානයක් තුලින් ආර්ථික අර්බුදයන්ට දරිද්‍රතාවයට විරැකියාවට හා බලයෙන් මෙන් විදේශිකයින් රටින් පිට කර යැවීමට විසඳුම් ලබාගත හැකිවනු ඇත.

මෙම අරමුණු සඳහා සිරිසා පක්ෂයේ ඇතුලතින් මෙන් පිටතින්ද ස්වාධීන ලෙස පන්ති සටන් දේශපාලනය ගොඩ නැංවීම අත්‍යාවශ්‍ය වෙයි. ජනමත විචාරණයට පෙර පැවති එපා යන තීරණයට පක්ෂපාතව පැවති ජනතා උද්ඝෝෂන අනුව යමින් එවන් මහා රැස්වීම් දිගටම සංවිධානය කල යුතුය. ට්‍රොයිකාවට එරෙහිව සමාජවාදී විකල්පයක් උදෙසා සිදු කරන අරගලයට වැඩ කරන ජනතාව හා තරුණ පිරිස් වඩ වඩාත් සහභාගී කර ගත හැකි වන සේ එම රැස්වීම් අඛණ්ඩවම සංවිධානය කල යුතුය. එයින් අදහස් වන්නේ වැඩ බිම් වලදීත් සමාජ ප්‍රජාව තුලත් සියලු පක්ෂ සමාජිකත්වයේ ක්‍රියාකාරී කමිටු පිහිටුවා ගනිමින් වඩාත් ජනප්‍රිය වන අයුරින් කමිටු නිර්මාණය කල යුතු බවයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දැඩි කප්පාදු කිරීමේ සැළසුමට විරුද්ධව සටන් කරමින් සමාජවාදී යුරෝපයක් බිහි කිරීම සඳහා සමස්ත යුරෝපීය කම්කරු ජනතාවටත් තාරුණ්‍යයටත් අප විසින් ආයාචනා කළ යුතුය. ජයග්‍රහණය ලැබීම ගැන අප දැඩි ලෙස විශ්වාස කරමින් ඉදිරියට තැබූ පියවර ආපස්සට හැරවීමට ඉඩ නොදී සටන් කරමු.

**- (CWI) සෙකිනිමා ග්‍රීක සමාජවාදී සංවිධානය -**

# ඔබේ ඡන්දයට වටිනාකමක් දෙන්න

තවත් පාර්ලිමේන්තු මැතිවරණයක් ඔබ ඉදිරියට පැමිණ තිබේ. මෙම මැතිවරණය නියමිත කාලයට පෙර පැවැත්වෙන්නේ අප රට මුහුණ දෙන තියුණු දේශපාලන, සමාජ හා ආර්ථික අර්බුදයේ ප්‍රතිපලයක් ලෙසය.

මෙවර මැතිවරණයේදී ඔබගේ ඡන්දය ස්ත්‍රී දූෂණ, කුඩු එතනෝල් ජාවාරම්කරුවන් කැසිනෝකාරයින් වැනි අපරාධකරුවන්ට නොදිය යුතු බවට ජනතා මතයක් ගොඩනැගෙමින් පවතී. එය ලාංකේය සමාජයේ වර්ධනය වෙමින් පවතින අගයකල යුතු සාධනීය ලක්‍ෂණයකි. එහෙත් එයින් පමණක් ජනතාවගේ ප්‍රශ්න වලට විසඳුම් නොලැබේ.

එසේ නමුදු පාර්ලිමේන්තු මැතිවරණයකදී ඡන්ද දායකයින් සැලකිමට ගතයුතු ප්‍රධාන දේශපාලන කරුණු කීපයක්ම ඇත. අපරට නිදහස ලැබී ගෙවීගිය වසර 68ක් කාලය තුල ප්‍රධාන ධනපති පක්‍ෂ දෙක වන එක්සත් ජාතික පක්‍ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂය ප්‍රමුඛ සන්ධාන රට පාලනය කර තිබේ. අප රටේ ප්‍රධානම ප්‍රශ්නය වන ජාතික ප්‍රශ්නය විසඳාලමින් තරුණ විරැකියාව, දුගීබාවය දුරු කොට, දුප්පත් ගොවි ජනතාව නගාසිටුවීම, අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීමට ශ්‍රීලනිපය හා එජාපයට නොහැකිවී ඇත. එසේම එජාපය හා ශ්‍රීලනිපය අතර අද ප්‍රතිපත්තිමය වෙනසක් ඇත්තේ නැත. තිබෙන්නේ මුහුණුවල වෙනසක් පමණී. අගෝස්තු 17න් පසු මෙම පක්‍ෂ දෙක එකම තැනකට පත්විය හැකිය. ඒ අධිරාජ්‍යවාදී නව ලිබරල් වැඩ පිළිවෙල ක්‍රියාවට දමා ගොවි කම්කරු තරුණ ජනතාවට මරු කැඳවීම සඳහාය. එබැවින් නැවත වරක් මෙම ධනපති පක්‍ෂ දෙක ජනතාවට දෙන රැවටිලිකාරී පොරොන්දු කෙරෙහි ඔබට විශ්වාසයක් තැබිය හැකිද? පැහැදිලිවම නැත යන්න ඔබේ පිළිතුර විය යුතුය.

අනෙක් පැත්තෙන් පිං කුසල්හාමි මාලු බානවා වැනි අන්දමට ජවිපෙය බොරදිය් මාලු අල්ලමින් ජනතාව රැවටීමේ ක්‍රියාවලියක නිරතව සිටි. ජනතා විමුක්ති පෙරමුණ 1994 සිට මේ දක්වා ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂය හා එක්සත් ජාතික පක්‍ෂය සමග විලිලැජ්ජාවක් නොමැතිව දීර්ඝකාලීන හවුල් දේශපාලනයක නිරත විය. ජවිපෙය 1994දී චන්ද්‍රිකා බලයට පත් කිරීමට කටයුතු කළ අතර 2005දී මහින්ද රාජපක්‍ෂ බලයට පත් කිරීමේ ප්‍රධාන හවුල්කරුවා වූයේ ජවිපෙයයි. ඉන් අනතුරුව යුද්ධයේදී මහින්ද රාජපක්‍ෂ සමග අත්වැල් බැඳගෙන කටයුතු කළේද ජවිපෙයයි. පසුව මහින්ද සමග ඇතිවූ ආරවුල් හේතුකොට ගෙන 2010 ජනාධිපතිවරණයේදී හිටපු හමුදාපති සරත් පොන්සේකා ජනාධිපති කිරීම සඳහා රනිල් ඇතුලු එජාපය සමග සන්ධානයකට එළැඹුනි. ඉන්පසු අනියමින් මෛත්‍රීපාල ජනාධිපති කිරීම සඳහා වේදිකා ගතවූ ජවිපෙය මෛත්‍රී - රනිල් ආණ්ඩුවේ විධායක සභාවේ අසුන්ගෙන එකට මගුල්කන තත්වයට පත්විය. ජවිපෙය සමාජවාදී ව්‍යාපාරය වෙනුවෙන් තවදුරටත් පෙනී නොසිටින අතර ඔවුන්ගේ එකම සටන්පාඨය ධනේෂ්වර පාලනය තුල ඊනියා පිරිසිදු ජනතා නියෝජිතයින් තෝරා ගැනීමේ බංකොලොත් දේශපාලනයක් බවට පත්ව ඇත.

මෙයින් පැහැදිලි වන්නේ මහින්දගේ සන්ධානය හා එජාපය මෙන්ම ජවියෙද නියෝජනය කරන්නේ ප්‍රතිගාමීත්වය හා පසුගාමීත්වයයි. සමාජ - දේශපාලන ප්‍රශ්න කෙරෙහි ඔවුන්ගේ ආකල්ප වැඩ වසම්වාදයෙන් හා ජාතිවාදයෙන් ඔබ්බට ගොස් නැත. මෙම සියලු ප්‍රතිගාමී බලවේග වලට එරෙහිව පැහැදිලි සමාජවාදී ඉදිරිගාමීත්වය නියෝජනය කරන්නේ එක්සත් සමාජවාදී පක්‍ෂය පමණී. අප සමාජයේ පැලපදියම්වී තිබෙන ජාතිවාදී හා පසුගාමී හැව ඉවත් කොට රට නූතන ලෝකය කරා ගෙනයා හැක්කේ කම්කරු පංතිය මත පදනම් වන වමේ බලවේගයකට පමණී.

- **ධනපති පංතියේ පක්ෂවලට කිසිදිනක මුක්කු නොගසන වමේ බලයක් උදෙසා**
- **ස්වයංනිර්ණය අයිතිය මත ජාතික ප්‍රශ්නය විසදා එක්සත් සමාජවාදී රටක් ගොඩනැගීම උදෙසා**
- **කාන්තා හිංසනය අහෝසිකර ස්ත්‍රීන්ට සමාන අයිතීන් ලබාදීමද**
- **කලා නිර්මාණ ඇතුළු නිදහස් අදහස් පළ කිරීමට ජනතාවට තිබෙන අයිති තහවුරු කිරීමද**
- **අධ්‍යාපන පුද්ගලිකරණය නතරකර අඩු ආදායම්ලාභි පවුල්වල දරුවන්ට නොමිලේ අධ්‍යාපනය ලැබීම සහතික කරලීම**
- **තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම ඇතුලු මැති ඇමති වරුන්ගේ වත්කම් බැරකම් ජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධියට පත් කිරීම**
- **වයස අවුරුදු 18 සම්පූර්ණ වන සෑම තරුණ තරුණියකටම රැකියාවක් ලබා ගැනීම සහතික කිරීම**
- **ලෝක වෙළද පොලේ බලපෑමට යටත්කර ඇති දේශිය ගොවියා ඉන් මුදවා ගෙන ඉඩම් හා ජල ප්‍රශ්නය විසදා රටේ සංවර්ධන ක්‍රියාවලියට ගොවියා හවුල්කර ගැනීම**
- **අධිරාජ්‍යවාදී වියගසින් රට මුදවා ගැනීම වස් ලෝක බැංකුව ඇතුලු සියලු විදේශ ණය ගෙවීම් වහාම අහෝසි කිරීම**
- **අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා රැකගෙන ජලය,විදුලිය, බැංකු, රක්ෂණය, වැවිලි අංශය වරාය, විදුලි සංදේශය වැනි වැදගත් ආර්ථික මර්මස්ථාන කම්කරු පංති ප්‍රජාතන්ත්‍රීය පාලනයක් යටතේ ජනතාව සතු කිරීම**
- **රාජ්‍ය සේවය කාර්යක්ෂම සේවාවක් බවට පත්කරමින් පෞද්ගලික අංශයේ පවතින අසීමිත සූරාකෑමඅහෝසිකර අනියම් කොන්ත්‍රාත් හා මෑන් පවර් නමින් පවතින සේවා ස්ථිර සේවක බවට පත්කර නිදහස් වෙළද කලාප කම්කරුවන්ට වෘත්තිය සමිතිවලට බැඳීමට තිබෙන අයිතිය හා වැඩ වර්ජන කිරීමට තිබෙන අයිතිය නිතිගත කිරීමද වතුකරයේ ජනතා වට රු1000/- දිනක වැටුප සහතික කිරීම ඇතුලුව**

ධනවාදය ජාතිවාදය හා සූරාකෑම අහෝසිකොට විරැකියාව දුගීබාවය දුරු කොට පරිසර හිතකාමී සමාජවාදී සංවර්ධනයක් උදෙසා ඔබේ ඡන්දය ත්‍රිරෝද රථය ලකුණට දෙන්න.




චාර්ල්ස් මහසෙන් රාජපක්ෂ කණ්ඩායම් නායක


ඩබ්.සුනිල් ශාන්ත බරණගල නියෝජ්‍ය නායක



නීතිඥ ශ්‍රීනාත් පෙරේරා කණ්ඩායම් නායක


පී එස් ජෙනුඩින් නියෝජ්‍ය නායක





සිරිතුංග ජයසූරිය කණ්ඩායම් නායක


එස්.නගලරාජා නියෝජ්‍ය නායක



එස්.ලියනගේ කණ්ඩායම් නායක


ඇස්.ඒ.ඩී. විජයකෝන් නියෝජ්‍ය නායක



අතුල ජෙමසිරි කණ්ඩායම් නායක


සෝමපාල ප්‍රනාන්දු නියෝජ්‍ය නායක

**The Committee for a Workers International**

The Committee for a Workers' International (CWI) is the socialist international organization to which the United Socialist Party is affiliated.
The CWI is organized in 45 countries and Works to unite the Working class and oppressed peoples against global capitalism and to fight for a Socialist world.
For more details including CWI publications
Write to : CWI,PO.Box 3688,London E 111YE,
email:cwi@worldsoc.co.uk




ඔබත් කූපනය පුරවා එවන්න

එක්සත් සමාජවාදී පක්ෂය
ஐக்கிய சோசலிச கட்சி
UNITED SOCIALIST PARTY

නම ------------------------------------
ලිපිනය ------------------------------------
------------------------------------
රැකියාව ------------------------------------
දුරකථනය
එක්සත් සමාජවාදී පක්ෂය

නො. 53/6,
ඊ. ඩී. දබරේ මාවත,
නාරාහේන්පිට,
කොළඹ -05.

Tel: 011 4510289

- USP Sri Lanka

- United Socialist Party

web - www.lankasocialist.com

Email: unitedsocialists@gmail.com

එම් කේ පියරත්න වන මා විසින් 53/6 ඊ ඩී දාබරේ මාවත නාරාහේන්පිට පිහිටි සමාජ පොත් පියස මුද්‍රණාලයෙහිදී මුද්‍රණය කරන ලදී